# මාධ්‍ය නිවේදනය

## ටැබ්ලට් පරිගණක ආශ්‍රයෙන් සමීක්ෂණ තොරතුරු රැස්කිරීමේ ක්‍රමය ආරම්භ කිරීම


ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

DCS/DG/PRESS දුරකථනය: 0112147458 ෆැක්ස්: 011-2147447


2016 නොවැම්බර් 28

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, විවිධ මට්ටමේ සංගණන හා සමීක්ෂණ පවත්වනු ලබන අතර එම තොරතුරු මඟින් ශ්‍රී ලංකාවේ ප්‍රජා විද්‍යාත්මක, සමාජයීය හා ආර්ථික යනාදී ක්ෂේත්‍රවල නිල සංඛ්‍යාති පිළියෙල කරනු ලැබේ. ඒ අතරින් ප්‍රධාන සමීක්ෂණයක් ලෙස සෑම වසරකම පවත්වන ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණය හැඳින්විය හැකි අතර එය රැකියා නියුක්තිය, රැකියා වියුක්තිය හා ශ්‍රම බලකාය වැනි සංඛ්‍යාති රැසක උපනතිය පිළිබඳ කාලීන දත්ත ඉදිරිපත් කිරීමේ අරමුණින් විධිමත් ක්‍රමවේදයකට අනුව තෝරාගත් නිවාස ඒකක 25,000ක නියැදියකින් තොරතුරු රැස් කරනු ලැබේ.

2017 වර්ෂයේ සිට ටැබ්ලට් පරිගණක උපයෝගී කර ගෙන තෝරාගත් නිවාස ඒකකවලට ගොස් තොරතුරු ලබා ගැනීම සඳහා, සම්මුඛ පරීක්ෂණ පවත්වන මොහොතේදීම දත්ත පරිගණකගත කිරීමේ ක්‍රමවේදය වන පරිගණක ආශ්‍රිත සම්මුඛ පරීක්ෂණ ක්‍රමය (Computer Assisted Personal Interviewing (CAPI)) යොදාගනිමින් ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණය සිදු කිරීමට සැලසුම් කර ඇත. මෙම ක්‍රමවේදය දෙපාර්තමේන්තුව තුල ස්ථාපිත කිරීමට පියවර ගනු ලැබුවේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව හා කොරියානු රජය එක්ව දියත් කරනු ලැබූ "KOSTAT" ව්‍යාපෘතිය මඟිනි. මෙම කර්තව්‍යය දියත් කිරීමේ නිල උත්සවය විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ලේකම් වසන්ත දේශප්‍රිය මහතාගේ ප්‍රධානත්වයෙන් 2016 නොවැම්බර් මස 28 වන දින පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා බත්තරමුල්ල "Water's Edge" හෝටලයේදී පැවැත්විණි.

පරිගණක ආශ්‍රිත සම්මුඛ පරීක්ෂණ ක්‍රමය (CAPI) ඔස්සේ, දත්ත රැස්කරන මොහොතේම එම දත්ත පරිගණකගත කිරීමට හැකිවීම නිසා දෙපාර්තමේන්තුව මඟින් පිළියෙල කරනු ලබන නිල සංඛ්‍යාතිවල ගුණාත්මකභාවයත් කාලීනභාවයත් තවදුරටත් ඉහල නැංවිය හැකි බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අමර සතරසිංහ මහතා පැවසීය.

කොරියානු ජනරජයේ මූල්‍ය ආධාර හා කොරියානු ජාතික සංඛ්‍යාලේඛන ආයතනයේ තාක්ෂණික සහයෝගය මත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2014 - 2016 කාලය තුල ක්‍රියාත්මක කළ මෙම "KOSTAT" ව්‍යාපෘතිය මඟින් අදියර තුනක් යටතේ දෙපාර්තමේන්තුවට ප්‍රතිපාදන ලබා දී තිබේ. මෙම ව්‍යාපෘතිය යටතේ 2014 වසරේදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ "සංඛ්‍යාන දත්ත කළමනාකරණය සහ සේවා පද්ධතිය" (Lanka SIS) ස්ථාපනය කළ අතර 2015 වසරේදී කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ පහසුකම් වැඩි දියුණු කිරීම යටතේ නවීන අංගසම්පූර්ණ පරිගණක විද්‍යාගාර දෙකක් ලබා දී තිබේ. 2016 වසරේදී දෙපාර්තමේන්තුවේ සමීක්ෂණ කටයුතු ඉහළ මට්ටමකින් තොරතුරු තාක්ෂණ ක්‍රම යොදා ගනිමින් සිදු කිරීම සඳහා ටැබ්ලට් පරිගණක ඇතුළු සියළුම මෘදුකාංග, දෘඪාංග සහ උපදේශන සේවා ලබා දීම හා ඉහත සඳහන් කළ පරිගණක ආශ්‍රිත සම්මුඛ පරීක්ෂණ ක්‍රමය ක්ෂේත්‍රය තුල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සියළු තාක්ෂණික සහ මූල්‍ය සහයෝගය ලබා දෙන ලදී.

ආචාර්ය ඒ.ජේ.සතරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව